> සත්ත්වෝද්‍යානයට සතුන් ඕනෑ වූ විට මුලින්ම අනෙකුත් විදේශීය සත්ත්වෝද්‍යානයන්හි එම සතුන් සිටීදැයි බැලිය යුතුයි. වෙනත් කිසිම සත්ත්වෝද්‍යානයක එම සතුන් නැති නම් පමණයි ඔවුන්ට වනජීවියෙන් ඉල්ලීමක් කරන්න පුළුවන් අනාථ සතුන් සත්ත්වෝද්‍යානය වෙත නිදහස් කිරීමට. මෙය අපි වනජීවියෙන් බලාපොරොත්තු වන දෙය නොවෙයි.

හොයා ගත්තෙ කැලේ අතරමං වෙලා ඉද්දි

ආපහු කැලේටම යවන්න පුනරුත්ථාපනය කළා

දැන් හදන්නෙ ජීවිත කාලයම හිරකාරයො කරන්න

මහ වලසයි පැටව් තුන් දෙනයි හිර කරලා ලබන සතුට මොකක්ද?

වඳවී යෑමේ තර්ජනයට ලක්වූ ශ්‍රී ලංකාවේ සත්ත්ව විශේෂ හතක් රැකබලාගෙන ආරක්ෂා කිරීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විශේෂ පොරොන්දුවක් දුන්නේ එහි 65 වැනි සංවත්සරය සැමරූ පසුගිය වසරේදීය. ගෙල කළු පැහැති කොකා (Black necked stork), කොටියා (Leopard), ආසියානු අලියා (Asian elephant), හම් කැස්බෑවා (Leatherback turtle), වලසා (Bear), කරදිය කිඹුලා (Salt water crocodile) හා නිල් තල්මහ (Blue whale) වනජීවී දෙපාර්තමේන්තුව මෙසේ නම් කළ සත්ත්ව විශේෂ හතයි.

මෙම සත්ත්ව විශේෂ වනය තුළදී රැක ගැනීමට විශේෂ අවධානයක් යොමුකරන බව වනජීවී අධ්‍යක්ෂ ජනරාල් එච්.ඩී. රත්නායක එදා පැවසුවද මේ වන විට එය කණපිට හැරී ඇති බව පෙනී යන්නේ අනාථව සිටිහ වලස් පැටවුන් තුන්දෙනකු හා වැඩිහිටි වලසකු ජාතික සත්ත්වෝද්‍යානයට භාර දීමට ඔහු විසින්ම ලබා දී ඇති අනුමැතිය හේතුවෙනි.

වලසුන් වඳවී යෑමේ ලැයිස්තුවට ස්වාභාවික පරිසරය හා ස්වාභාවික සම්පත් ආරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර ඒකකයේ (IUCN) ලැයිස්තුගත කර ඇති අතර වෘක්ෂ ලතා ආරක්ෂණ ප්‍රඥප්තිය මඟින්ද දැඩි ලෙස සුරක්ෂිත කොට ඇති සත්ත්ව විශේෂයක් වේ.

මෙම වලස් පැටවුන් තුන් දෙනා හා වැඩිහිටි වලසා සත්ත්වෝද්‍යානය වෙත නිදහස් කිරීමට අනුමැතිය ලබාදීම ගැන මෙන්ම ඒ සම්බන්ධයෙන් හිටපු සංචාරක හා ක්‍රීඩා ඇමැතිවරයා වන නවීන් දිසානායක මහතාට හා අමාත්‍යාංශ ලේකම් එම්.අයි.එම්. රෆීක් මහතාට දැන්වීමට පියවර නොගැනීම ගැන පරිසරවේදීන් වනජීවී අධ්‍යක්ෂ රත්නායක මහතාව විවේචනය කරන්නේ අදාළ තීරණය ගෙන ඇත්තේ වලසුන් තිදෙනාව නැවත වනයට මුදාහැරීම සඳහා පුනරුත්ථාපනය කරමින් සිටින අතරතුරදී බැවිනි.

ජාතික සත්ත්වෝද්‍යානයේ අධ්‍යක්ෂ ජනරාල් අනුර ද සිල්වා විසින් අමාත්‍යාංශ ලේකම් රෆීක් වෙත 2015 ජූලි 7 දින යැවූ ලිපියකින් කියා තිබුණේ පින්නවල වාගොල්ලේ පිහිටුවූ නව නිදහස් සත්ත්ව උද්‍යානයට තවත් සතුන් ඕනෑ වී ඇති බවත් දිසානායක ඇමැතිවරයා තමන්ගෙන් එහි සිටින සත්ත්ව විශේෂ ගණන වැඩි කරන ලෙස ඉල්ලා සිටි බවත්ය. "මා රත්නායකගෙන් සත්ත්වෝද්‍යානය සඳහා දේශීය සතුන් ඉල්ලා සිටියා. වාගොල්ලේ සත්ත්වෝද්‍යානයේ වලස් කොටුවේ වැඩ 2015 ඔක්තෝබර් වෙද්දී නිම වීමට නියමිත හෙයින් ඊට තවත් වලසුන් අවශ්‍යයි." යනුවෙන් සිල්වා තම ලිපියේ සඳහන් කොට තිබේ. ශාක හා සත්ත්ව ආරක්ෂණ ප්‍රඥප්තිය මඟින් වනජීවී අධ්‍යක්ෂවරයාගේ අවසරය මත කැලෑවෙන් අවශ්‍ය සතුන් අල්ලා ගැනීමට විධිවිධාන සලසා තිබුණද පරිසරවේදීන්ගෙන් හා පාරිසරික කටයුතු හා බැඳුණු රාජ්‍ය නොවන සංවිධානවලින් බොහෝ විරෝධතාවන් එල්ල විය හැකි නිසාවෙන් තමා ඒ කෙරෙහි යොමු නොවුණු බවද එම ලිපියේ සඳහන් වේ. එසේ හෙයින් වනජීවියට හමුවන අතරමංවී හෝ අනාථව සිටින ඕනෑම වන සතකු එළිමහන් කූඩුවල රඳවා තැබීම සඳහා ලබා දෙන ලෙසද එම ලිපිය මඟින් වනජීවී අධ්‍යක්ෂ ජනරාල් රත්නායකගෙන් ඉල්ලා තිබේ.

වලසුන් හතරදෙනා වාගොල්ල එළිමහන් වලස් කූඩුවේ වැඩ කටයුතු නිම වනතෙක් හම්බන්තොට සෆාරි පාර්ක්හි රඳවා තබනු ඇති බව සිල්වා සිය ලිපියේ සඳහන් කර ඇත.

රෆීක් විසින් 2015 ජූලි 8දා රත්නායක වෙත ලිපියක් යවමින් රත්නායක විසින් ඇමැති දිසානායක සමඟ කළ සාකච්ඡාව අනුව වලසුන් හතර දෙනා ජාතික සත්ත්වෝද්‍යානයට භාර දෙන ලෙසට දැනුම් දී ඇත. මෙම වලස් පැටවුන් වනජීවිය විසින් කැලයට යැවීම සඳහා පුනරුත්ථාපනය කරමින් සිටි බව තමා දැනගෙන නොසිටියේ යැයි මේ සම්බන්ධව කරුණු පැහැදිලි කරමින් ජාතික සත්ත්වෝද්‍යානයේ අධ්‍යක්ෂ ජනරාල් සිල්වා කියයි. කෙසේ වුවත් මේ වලස් පැටවුන් කැලයට මුදා හැරීම දුෂ්කර බවත් විශේෂයෙන්ම එක් වලස් පැටවකුගේ වයස යන්තම් මාස තුනක් පමණක් වන හෙයින් කැලය තුළ ජීවත් වීමේ හැකියාවක් නැති බවත් ඔහු පවසයි.

"අනුර සිල්වා මට කතා කර සත්ත්වෝද්‍යානයේ කොටි, වලසුන් වැනි සමහර සත්ත්ව විශේෂ හිඟයක් පවතින බව කියා එම සතුන් කැලයෙන් අල්ලා ගැනීමට මගේ අවසරය ඉල්ලා සිටියා. සත්ත්වෝද්‍යානයට අවශ්‍ය සතුන් කැලයෙන් අල්ලා ගැනීමට සත්ත්වෝද්‍යාන බලධාරීන්ට අවසර දීමට පනත මඟින් බලය පවරා තිබුණත් මා එය ප්‍රතික්ෂේප කළා. ඉන් පසුව සිල්වාට ඕනෑ වුණා විදෙස් රටවලින් සතුන් මෙහි ගෙන එන්නට. එයට මා විරුද්ධ වුණේ විදේශීය සතුන් සමඟ අපේ සතුන්ට වැලඳිය හැකි රෝග පැමිණිය හැකි නිසයි. ඊට පසුවයි තීරණය වුණේ අනාථ වූ සතුන් හමුවූ ගමන් ඔවුන්ව සත්ත්වෝද්‍යානයට භාර දීමට.

වන සතුන් කූඩු කර තබනවාට මා විරුද්ධයි. කෙසේ වුවත් මෙම වලසුන් එළිමහන් කොටුවක රඳවා තැබීමටත්, කූඩුවකට සීමා නොකිරීමටත් කටයුතු කරන බව සිල්වා දැනුම් දුන්නා. මෙම සතුන් අනාගතයේදී සත්ත්වෝද්‍යානය තුළ බෝ කරන බවට එකඟතාවක් මත මෙම සතුන් ලබා දෙන නිසා අනාගතයේදී සත්ත්වෝද්‍යානයට මෙම සතුන් කැලයෙන් ලබා ගැනීමට ඕනෑ වෙන එකක් නැහැ." යනුවෙන් රත්නායක කරුණු පැහැදිලි කළේය.

සොබා සංස්කෘතික අධ්‍යයන කේන්ද්‍රයේ නිලධාරියකු, රත්නායක හා සිල්වා අතර ඇති කරගෙන ඇති එකඟතාව ගැන ප්‍රශ්න කරමින් සතුන් සුරක්ෂිත කර අභිජනනය කරන මධ්‍යස්ථානයක් වන සත්ත්වෝද්‍යානය වසර ගණනාවක් තිස්සේ වලසුන් අභිජනනය කර නැති බව වනජීවී අධ්‍යක්ෂවරයා දන්නවාදැයි විමසීය. මෙම සතුන් අවසානයේදී සත්ත්ව හුවමාරු වැඩසටහනක කොටසක් ලෙස විදේශයක රැඳෙනු ඇති බවත් ඔහු පැවැසීය.

"දෙහිවල සත්ත්වෝද්‍යානය සතුව වලසුන් සිටියත් එම සතුන්ව අවුරුදු ගණනාවකින් අභිජනනය කර නැහැ. දෙහිවල සත්ත්වෝද්‍යානය සතු වලසුන් පින්නවලට යවා අභිජනනය ආරම්භ කරනු වෙනුවට වඳවීගෙන යන මෙම වලස් විශේෂය පුනරුත්ථාපනය කොට කැලයට යැවීමේ වැඩපිළිවෙළට බාධා කරන්නේ ඇයි? සත්ත්වෝද්‍යානය සෑහෙන වාර ගණනක් විදේශයන්ගෙන් සතුන් ගෙන්වා තියෙනවා. එම සතුන් සත්ත්වෝද්‍යානයට යොමු කිරීමට පෙර දැඩි නිරෝධායන ක්‍රියාවලියකට බඳුන් කෙරෙන නිසා දේශීය සතුන්ට රෝග බෝ වීමට ඉඩ ඇති බව කියමින් වදවීමට කාරණාවක් නැහැ." එම නිලධාරියා කියා සිටියේය.

> දෙහිවල සත්ත්වෝද්‍යානය සතුව වලසුන් සිටියත් එම සතුන්ව අවුරුදු ගණනාවකින් අභිජනනය කර නැහැ. දෙහිවල සත්ත්වෝද්‍යානය සතු වලසුන් පින්නවලට යවා අභිජනනය ආරම්භ කරනු වෙනුවට වඳවීගෙන යන මෙම වලස් විශේෂය පුනරුත්ථාපනය කොට කැලයට යැවීමේ වැඩපිළිවෙළට බාධා කරන්නේ ඇයි?

පරිසරවේදීන්ගේ චෝදනාවලට පිළිතුරු දෙමින් සිල්වා කියා සිටියේ දෙහිවල සත්ත්වෝද්‍යානය දිගු කලක් තිස්සේ වලසුන් අභිජනනය කර නොමැති බවයි. දෙහිවල සතුන්වත්තේ සිටින්නේ වලසුන් තිදෙනකු බව කී ඔහු ඉන් සරු වයසේ පසුවන වලසුන් දෙදෙනා එකම කූඩුවක තබා තිබුණත් මෙතෙක් ඔවුන් පැටවුන් නොදැමූ බවද ඔහු කියා සිටියේය.

"දයාකාරයක සත්ත්ව ආරක්ෂණ වැඩපිළිවෙළ තිබෙන බව පරිසරවේදීන් හා සත්ත්ව ක්‍රියාකාරීන් දැන ගත යුතුයි. සත්ත්වයන් රැක ගැනීමේදී සිටින ස්ථානයේම තබා කෙරෙන In-Situ conservation හා සිටින ස්ථානයෙන් බැහැරව කරන Ex-Situ conservation යන ක්‍රම දෙකක් තිබෙනවා. වනජීවියේ වගකීම වන්නේ වන සතුන් ඔවුන්ගේ ස්වාභාවික භූමිය වන වනය තුළම ආරක්ෂා කිරීමේ In-Situ conservation ආරක්ෂණ ක්‍රමය සිදු කිරීමයි. සත්ත්වෝද්‍යාන සිදු කරන්නේ සතුන්ගේ ස්වාභාවික භූමියෙන් පිටත සීමා කරන ලද ප්‍රදේශයන් තුළ සතුන් ආරක්ෂා කිරීමේ Ex-Situ conservation ක්‍රමයයි. මෙම ක්‍රමයේ වැදගත්කම වන්නේ රැකබලා ගන්නා සතුන් පැටවුන් බෝ කළ විට කැලයේ සිටින සතුන් වඳවී ගිය අවස්ථාවකදී එම සතුන් කැලයට නිදහස් කිරීමට සත්ත්වෝද්‍යාන බලධාරීන් සතු වගකීමයි." යනුවෙන් රත්නායක පැහැදිලි කළේය.

"සත්ත්වෝද්‍යානයට සතුන් ඕනෑ වූ විට ඔවුන් මුලින්ම අනෙකුත් විදේශීය සත්ත්වෝද්‍යානයන්හි එම සතුන් සිටීදැයි බැලිය යුතුයි. වෙනත් කිසිම සත්ත්වෝද්‍යානයක එම සතුන් නැති නම් පමණයි ඔවුන්ට වනජීවියෙන් ඉල්ලීමක් කරන්න පුළුවන් අනාථ සතුන් සත්ත්වෝද්‍යානය වෙත නිදහස් කිරීමට. මෙය අපි වනජීවියෙන් බලාපොරොත්තු වන දෙය නොවෙයි."

මේ වලසුන් හතර දෙනා පුනරුත්ථාපන වැඩසටහනකට යොමු කර තිබූ අතර මෙම ක්‍රියාව හේතුවෙන් වනජීවිය මඟින් වඳවී යෑමේ අවදානමට හා තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂයන් රැක ගැනීමට ඇරැඹූ කටයුතු නවතිනු ඇතැයි සොබා සංස්කෘතික අධ්‍යයන කේන්ද්‍රයේ නිලධාරියකු කරුණු පැහැදිලි කරමින් සඳහන් කළේය.

රිෂිදා මෙන්ඩිස්
සිලෝන් ටුඩේ පුවත්පතට ලියූ ලිපිය
■ පරිවර්තනය - රූ කාරියවසම්

ලෙඩ වෙලා දුක් විඳිනවද? සොබාදම් මවට කීකරු වෙනවද?

සෞඛ්‍යය යනු ලෙඩ රෝගවලින් තොරවීම පමණක් නොවේ. මිනිසුන්ගේ කායික, මානසික, සමාජීය හා ආධ්‍යාත්මික යහපැවැත්මද එමඟින් අදහස් වේ. මිනිසාගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ කාර්යයේදී මානව සෞඛ්‍ය සංරක්ෂණයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. සෙසු ආසියාතික රටවල් මෙන්ම සංවර්ධිත බටහිර රටවල් හා සැසඳීමේදී පවා ශ්‍රී ලංකාවේ ජනතාවගේ සෞඛ්‍යය සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින බව විවිධ දර්ශක හා වාර්තා මඟින් පෙන්නුම් කර තිබේ. නමුත් දේශගුණ විපර්යාස හේතුවෙන් ලෝකයා විසින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මෙතෙක් අත්කරගනු ලැබ ඇති ප්‍රගතිය අඩසියවසකින් යළි පසුපසට ඇද දමනු ඇති බව විද්‍යාඥයෝ පෙන්වා දෙති.

දේශගුණ විපර්යාස මානව සෞඛ්‍යයට නිශ්චිතවම හේතුවන පිරිසුදු වාතය, සුරක්ෂිත පානීය ජලය, ප්‍රමාණවත් පෝෂණීය ආහාර හා සුරක්ෂිත වාසස්ථාන යන සමාජීය හා පාරිසරික තත්ත්වයන්ට සෘජු බලපෑම් එල්ල කරයි. එමඟින් ඇතිවන මන්දපෝෂණය, මැලේරියාව, උදරාබාධ හා උණුසුම් ආතතිය (Heat Stress) හේතුවෙන් 2030-2050 කාලසීමාවේදී දැනට සිදුවන මිනිස් මරණවලට අමතරව වාර්ෂිකව 250,000ක් දෙනා මරණයට පත්වනු ඇතැයි අනුමාන කෙරේ. වර්ෂ 2030 වන විට දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන සෞඛ්‍ය ආපදාවන්ගේ පිරිවැය වසරකට ඇමෙරිකානු ඩොලර් බිලියන 2-4ත් අතර වනු ඇති බවද පිළිගැනේ. මේ පිරිවැය සෞඛ්‍ය සංරක්ෂණයට දායක වන කෘෂිකර්මය, ජලය හා සනීපාරක්ෂාව යන සංරචකයන්ට වැයවන පිරිවැයට අමතර පිරිවැයක් බවද අප අවධාරණය කරගත යුතුය.

පසුගිය ශතවර්ෂයක පමණ කාලසීමාව තුළ ගෝලීය උෂ්ණත්වය අවම වශයෙන් සෙල්සියස් අංශක 0.75කින් ඉහළ ගොස් තිබේ. මිනිසාගේ නොහික්මුණු හැසිරීම හේතුවෙන් ඉවක් බවක් නැතිව පොසිල ඉන්ධන දහනය කිරීම වැනි හේතු නිසා දේශගුණ පද්ධතියට එක් රැස්වන කාබන්ඩයොක්සයිඩ් වැනි හරිතාගාර වායු මෙම තත්ත්වයට සෘජුව බලපා ඇත. මුහුදු මට්ටම ඉහළ යෑම, ග්ලැසියර දියවීම හා වර්ෂාපතන රටාවේ වෙනස්කම් එහි ප්‍රතිඵලයන්ය. ගංවතුර හා නියඟ වැනි ආන්තික කාලගුණ බලපෑම් වඩාත් තීව්‍ර හා බහුල ආකාරයෙන් මිනිස් ජීවිතවල පැවැත්මට හා සෞඛ්‍යට තර්ජන එල්ල කරන්නේ ඒ හේතුවෙනි.

දේශගුණ විපර්යාස හේතුවෙන් අධික උණුසුම් කාලගුණ තත්ත්වයන් ඇතිවීම ලොව පුරා විවිධ රටවල ජනතාවගේ සෞඛ්‍යයට ඇති කරන්නේ නොතකා සිටිය නොහැකි තරම් බලපෑමකි. විශේෂයෙන් සමකාසන්න ඉන්දියාව හා පාකිස්තානය වැනි රටවල අධික උණුසුම දරාගත නොහැකිව මිනිසුන් මරණයට පත්වීම පිළිබඳ දැන් දැන් නිතර අසන්නට ලැබේ. එමඟින් හෘදවාහිනී හා ශ්වසන රෝග මඟින් විශේෂයෙන් වැඩිහිටි පුද්ගලයන් මරණයට පත්වීම දැකිය හැකිය. මෙම වසරේ පමණක් ඉන්දියාව හා පාකිස්තානය යන රටවල පමණක් අධික උණුසුම හේතුවෙන් මරණයට පත්වී ඇති මිනිසුන් ප්‍රමාණය දහස් ගණනකි. 2003 වසරේ ගිම්හානයේදී ඇතිවූ උණුසුම් වායු ධාරා හේතුවෙන් යුරෝපයේ වාර්ෂික මරණ ප්‍රමාණය 70,000කින් ඉහළ ගොස් තිබේ. සෘජු මරණවලට අමතරව උෂ්ණත්වය ඉහළ යෑම හේතුවෙන් වායුගෝලයේ ඕසෝන් හා වෙනත් දූෂ්‍යකාරක ප්‍රමාණය ඉහළ යෑම නිසා හෘදවාහිනී හා ශ්වසන රෝග තත්ත්වයන් උත්සන්න වීමද සිදුවේ. ශ්වසන පද්ධතියේ ආසාත්මිකතා ඇතිකරන පරාග හා වෙනත් ආසාත්මිකකාරක ප්‍රමාණය වායුගෝලයේ ඉහළ යෑමටද උණුසුම් කාලගුණය හේතුවේ. එමඟින් ඇදුම රෝගය උත්සන්න වීමෙන් ලොව වටා මිලියන 300ක පමණ ජනතාවක් පීඩාවට පත්වී ඇත.

දේශගුණ විපර්යාස හේතුවෙන් නිරන්තරයෙන් ඇතිවන ස්වාභාවික විපත්ද මානව සෞඛ්‍යයට එල්ල කරන්නේ බරපතළ තර්ජනයකි. 1960 වසර දක්වා වාර්ෂිකව සිදුවූ කාලගුණය සම්බන්ධ ස්වාභාවික විපත් සංඛ්‍යාව මේ වන විට තුන් ගුණයකින් ඉහළ ගොස් තිබේ. අතීතයේ කිසි කලෙකත් නොවූ විරූ තීව්‍ර හා සුලබ ආකාරයෙන් ඇතිවන සුළිසුළං, ගංවතුර හා නායයෑම් වැනි ස්වාභාවික විපත් හේතුවෙන් වසරකට වැනසී යන මිනිස් ජීවිත ප්‍රමාණය 60,000 ඉක්මවයි. එම මරණ වැඩි ප්‍රමාණයක් වාර්තා වන්නේ අප වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල බවද අප අවධාරණය කරගත යුතුය. මුහුදු මට්ටම ඉහළ යෑම හා ආන්තික කාලගුණ තත්ත්වයන් මඟින් මානව ජනාවාස, සෞඛ්‍ය හා සෙසු යටිතල පහසුකම් විනාශ කිරීමද මානව සෞඛ්‍යයට ඉතා බරපතළ ලෙස බලපෑම් කරයි. දේශගුණ විපර්යාසයේ සෞඛ්‍ය බලපෑම පිළිබඳ කතා කිරීමේදී දේශගුණ අනාථයන් (Climate refugies) සම්බන්ධයෙන්ද කතා නොකරම බැරිය.

මුහුදු මට්ටම ඉහළ යෑම දේශගුණ විපර්යාසයේ සෘජු බලපෑමකි. ඒ හේතුවෙන් මුහුදු මට්ටමට ඉතා ආසන්න කුඩා දූපත් රාජ්‍යවල දිවි ගෙවන හා විශාල රටවලට අයත් කුඩා දූපත්වල දිවි ගෙවන ජනතාවට මෙන්ම ගංගා මෝය හා නිම්න ආශ්‍රිතව ජීවත්වන ජනතාවට පවා අභියෝග එල්ල වේ. සමස්ත ලෝක ජනගහනයෙන් අඩකටත් වඩා පිරිසක් ජීවත් වන්නේ මුහුදු වෙරළේ සිට කිලෝමීටර් 60 සීමාව තුළ වන අතර තම ගම්බිම් හැර යෑමට එම ජනතාවට දේශගුණ විපර්යාස හේතුවෙන් උත්සන්න වන මුහුදු මට්ටම ඉහළ යෑම මඟින් තර්ජනය කරයි. එම අවතැන් කිරීම විසින් ජනතාවට මානසික ආතතියේ සිට බෝවන රෝග දක්වා විවිධ සෞඛ්‍ය තර්ජන ඇති කරනු ලබයි. දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලයට (IPCC) අනුව වර්ෂ 2100 වන විට පැසිෆික් සාගරයේ ජල මට්ටම මීටර් 0.19-0.58 ක ප්‍රමාණයකින් ඉහළ යෑමට නියමිතය. එමඟින් උත්සන්නවන වෙරළ ඛාදනය හා ගංගා දෙපස පහත් බිම් ජලයෙන් යටවීම මඟින් විශාල වශයෙන් ජනතාව අවතැන්භාවයට පත් කරනු නොඅනුමානය. වර්ෂ 2050 වන විට බංග්ලාදේශයට මීටර් 0.3-1.5ක ප්‍රමාණයකින් මුහුදු මට්ටම ඉහළ යෑමට මුහුණදීමට සිදුවේ. එමඟින් වර්ෂ 2100 වන විට එරට මිලියන 30ක ජනතාවක් දේශගුණ අනාථයන් බවට පත්වේ.

භූමිය දියබත්වීමට අමතරව ජලයේ ලවණතාව අධිකවීම, ජලවහනයට අවහිරතාවන් ඇතිවීම, ව්‍යසනකාරී සුළිසුළං හා ඉහළ යන උදම්රළ මඟින්ද වෙරළාසන්නව හා ගංගා දෙපස ජීවත්වන ජනතාවගේ ජීවිත අභියෝගයට ලක්වේ. එම උවදුරුවලින් බේරීම සඳහා පලායන දේශගුණ අනාථයන්ට පෙරළා ආහාර හිඟය, බෝවන රෝග ව්‍යාප්ත වීම, අධික ජන ඝනත්වය හා මානසික ආතතිය නිසා විශාල සෞඛ්‍ය ගැටලු ප්‍රමාණයකට මුහුණ දීමට සිදුවේ. ශීඝ්‍රයෙන් වෙනස්වන වර්ෂාපතන රටාව මඟින් මිනිසාට යහපත් සෞඛ්‍ය තත්ත්වයක් පවත්වාගෙන යෑම සඳහා මහත් සේ අත්‍යවශ්‍ය පිරිසුදු ජලය සපයා ගැනීමට අවහිරතා ඇති කරයි. නියඟ හේතුවෙන් ජල සම්පත සීමාවීම මෙන්ම ගංවතුර හේතුවෙන් ජලය තිබුණද ඒවා භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වීම දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන ආන්තික කාලගුණ තත්ත්වයන්ගේ ප්‍රතිඵල බව නොකිවමනාය.

■සුපුන් ලහිරු ප්‍රකාශ්

■සංස්කරණය - හසිත කුරුප්පු
ruk.mawbima@gmail.com

අලිමංකඩ

කැලෑ හඬ
Wild Life

■පිටු සැකැසුම - ලක්රූ රන්දික

'අලි ඇතුන් සමඟ ජීවිතය' ගැන විද්වත් සංවාදයක්

පරිසරවේදී සුපුන් ලහිරු ප්‍රකාශ්ගේ අලි ඇතුන් සමඟ ජීවිතය කෘතිය පිළිබඳ විමසුමෙන්

ලංකාවේ පරිසර සංරක්ෂණ ක්‍රියාවලියට සැබෑ ලෙසම කැපවූ පරිසර ක්‍රියාධරයන් හා පරිසර ජනමාධ්‍යවේදීන් සිටින්නේ ඉතා සීමිත පිරිසක් බවත් ඔවුන් ආරක්ෂා කරගැනීමට කටයුතු නොකළහොත් ඉදිරියේදී මෙරට පරිසරය පිළිබඳව කතා කිරීමට දෙයක් ඉතිරි නොවන බවත්, පරිසරවේදී සුපුන් ලහිරු ප්‍රකාශ් මහතාගේ ජීවිතයට එවැනි තර්ජන එල්ල වූ අවස්ථා ගණනාවක් ඇති බවත් පරිසරවේදී සජීව චාමිකර මහතා ප්‍රකාශ කළේය. නිදහස් පරිසර ලේඛකයකු හා පරිසර ක්‍රියාකාරිකයකු වන සුපුන් ලහිරු ප්‍රකාශ් විසින් රචිත "අලි ඇතුන් සමඟ ජීවිතය" කෘතිය පිළිබඳ පසුගියදා කොළඹ පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල ශ්‍රවණාගාරයේදී පැවැති විද්වත් සංවාදයකදී ඔහු මේ අදහස් පළ කළේය.

ශ්‍රී ලංකාවේ අලි - මිනිස් ගැටුම් පාලනය හා වන අලි සංරක්ෂණය සම්බන්ධයෙන් විවිධ අවස්ථාවල විවිධ කෝණවලින් විග්‍රහ කරමින් මෙරට ජාතික පුවත්පත්වලට පුරා දශකයකට ආසන්න කාලයක් තිස්සේ සපයන ලද ලිපි අතරින් තවදුරටත් සමාජ කතිකාවතක් ඇතිවිය යුතු කරුණු අඩංගු ලිපි ඇතුළත් කර සුපුන් ලහිරු විසින් මෙම කෘතිය රචනා කරනු ලැබ ඇත.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ චාමිකර මහතා ප්‍රකාශ කළේ අලි ඇතුන් සංරක්ෂණය සම්බන්ධයෙන් රටට අවශ්‍ය ප්‍රතිපත්තිමය යොමුවක් සකස් කරගත යුතු ආකාරය පිළිබඳව විග්‍රහයක් මෙම කෘතියේ අන්තර්ගත වන බවය. මෙම විෂයට අදාළ දෙපාර්තමේන්තු, පරිසර අමාත්‍යාංශය හා ප්‍රතිපත්ති සම්පාදකයන්ට මඟපෙන්වීම් ග්‍රන්ථයක් ලෙස මෙම කෘතිය ක්‍රියා කරන බවය.



මෙහිදී අදහස් දැක්වූ ශ්‍රී ලංකාවේ සිටින දෙස් විදෙස් පතල වනජීවී පර්යේෂකයකු වන ආචාර්ය පෘතිවිරාජ් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කළේ, මේ වන විට ශ්‍රී ලංකාවේ පවතින ඉතාම බරපතළ සමාජාර්ථික හා පරිසර ප්‍රශ්නයක් වන අලි - මිනිස් ගැටුම කළමනාකරණය කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු විවිධ පාර්ශ්ව විවිධ උත්සාහයන් දරා ඇතත් මෙම අරගලය එන්න එන්නම ඉහළ ගොස් ඇති බවය. වැඩිවන මිනිස් ජනගහනයේ සංකීර්ණ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සංවර්ධනය අත්‍යවශ්‍ය නමුත් සංවර්ධනය හා සංරක්ෂණය නිසියාකාරව ගළපා ගැනීමට කටයුතු නොකළහොත් ඉදිරියේදී මෙම ඛේදවාචකය තවත් තීව්‍රවූ තත්ත්වයට පත්විය හැකි බව හෙතෙම වැඩිදුරටත් පැවැසීය. එබැවින් අලි ඇතුන්ගේ පැවැත්ම සුරක්ෂිත කරගනිමින් මිනිස් අවශ්‍යතා සපුරාගත හැකි තිරසාර ක්‍රමවේද වෙත නැඹුරුවීම කාලීන අවශ්‍යතාවක් බැවින් ඒ සඳහා වැදගත් කරුණු රැසක් "අලි ඇතුන් සමඟ ජීවිතය" කෘතිය මඟින් හෙළිදරව් කර ඇති බව ආචාර්යවරයා පැවැසීය.

වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් ගාමිණී රාජකරුණා මහතා විසින් මුලසුන හොබවන ලද මෙම සංවාදයේදී හිටපු දිනමිණ කර්තෘ බන්දුපාල ගුරුගේ, පරිසර හා සොබාදහම් අධ්‍යයන මධ්‍යස්ථානයේ ජාතික සම්බන්ධීකාරක පරිසරවේදී රවීන්ද්‍ර කාරියවසම්, පළමු වැනි ශ්‍රේණියේ වනසත්ත්ව අඩවි ආරක්ෂක නිලධාරීන්ගේ සංගමයේ කැඳවුම්කරු ඩබ්.ඒ.ඒ.ඩී.යූ. ඉන්ද්‍රජිත්, පාරිසරික හා සංස්කෘතික අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ පරිසරවේදී සුජීව ජාසිංහ හා ගල්ගමුව, ඇහැටුවැව, නාකොලගනේ පරිසරය සුරැකීමේ සංවිධානයේ සභාපති ඩබ්.එම්. විජය කුමාරපාල යන මහත්වරු අදහස් දැක්වූහ.

> ආචාර්ය පෘතිවිරාජ් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කළේ, මේ වන විට ශ්‍රී ලංකාවේ පවතින ඉතාම බරපතළ සමාජාර්ථික හා පරිසර ප්‍රශ්නයක් වන අලි - මිනිස් ගැටුම කළමනාකරණය කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු විවිධ පාර්ශ්ව විවිධ උත්සාහයන් දරා ඇතත් මෙම අරගලය එන්න එන්නම ඉහළ ගොස් ඇති බවය.

නාගරික අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණු වැඩමුළුවක්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වනවිද්‍යා හා පරිසර කළමනාකරණ දෙපාර්තමේන්තුව අනුබද්ධිත තිරසාරත්වය උදෙසා කේන්ද්‍රය (Center for Sustainability) මඟින් සංවිධානය කෙරෙන නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සිවු දින පුහුණු වැඩමුළුවක් එළැඹෙන සැප්තැම්බර් 2, 3, 4 සහ 5 දිනයන්හිදී එම විශ්වවිද්‍යාලයේදී පැවැත්වේ. නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ නවීන දැනුම ඊට උනන්දුවක් දක්වන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, සංවිධාන හා පුද්ගලයන් වෙත ලබාදීමේ අරමුණෙන් සංවිධානය කෙරෙන මෙම පුහුණු වැඩමුළුවේදී අපද්‍රව්‍ය ජනනය වීම අවම කිරීම, ප්‍රතිචක්‍රියකරණය, සමෝධානිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, ජීව වායු නිෂ්පාදනය, පරිසර හිතකාමී නිෂ්පාදන පිළිවෙත්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ නෛතික පසුබිම වැනි ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ න්‍යායාත්මක දැනුම හා ක්ෂේත්‍ර චාරිකා මඟින් ප්‍රායෝගික අත්දැකීම් ලබාදීමට නියමිතය. මෙම වැඩමුළුව සාර්ථකව නිම කරන සියලුදෙනාට වටිනා සහතික පත්‍රයක්ද පිරිනැමේ. 011 - 2758414, 077 - 1115565 යන දුරකතන අංකවලින් හා sustainability@sjp.ac.lk යන විද්‍යුත් ලිපිනය භාවිතයෙන් ට්‍රිෂාන් පෙරේරා මහතා සම්බන්ධ කර ගැනීමෙන් මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.